# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2481/09 - 2026 මාර්තු මස 24 වැනි අඟහරුවාදා - 2026.03.24**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

**2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත**

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 105 වගන්තිය සමග කියවිය යුතු 106 (1), 32 සහ 33 යන වගන්ති යටතේ සකස් කළ රීති.

ආචාර්ය **පී. නන්දලාල් වීරසිංහ,**
මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

2026 මාර්තු මස 24 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ.

**ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සම්පාදිත රීති**

1. මෙම රීති "සංචිත අවශ්‍යතා සඳහා වන 2026 අංක 01 දරන රීති", ලෙස හඳුන්වනු ලැබිය යුතුය.

2. මෙම රීති ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා අදාළ වේ.

3. 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ (*මෙතැන් සිට "පනත" යනුවෙන් හඳුන්වනු ලැබේ*) 32 සහ 33 වගන්තිවල විධිවිධාන ප්‍රකාරව කටයුතු කරමින්, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා රාමුව සම්බන්ධයෙන් පහත රීති නිකුත් කරනු ලබයි.

4. පනතේ 32වන වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බලපත්‍රලාභී වාණිජ බැංකු සිය තැන්පතු වගකීම් මත සංචිත පවත්වා ගත යුතු වේ.


1A - G 46508 — 23 (2026/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

5. (i) පනතේ 33වන වගන්තිය ප්‍රකාරව, ඉහත අංක 4 රීතියෙහි දක්වා ඇති පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ඔවුන්ගේ වගකීම්වලින් *සියයට දෙකක (2%)* ප්‍රමාණයක සංචිත අවශ්‍යතාවක් පවත්වා ගත යුතුය.

(ii) ඉහත රීති අංක 4හි දක්වා ඇති පරිදි තැන්පතු වගකීම් මත වාණිජ බැංකුවක් විසින් පවත්වා ගත යුතු සංචිත අවශ්‍යතාව රුපියල් තැන්පතුවක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ තැබිය යුතුය.

6. මෙම රීති යටතේ අවශ්‍ය සංචිත ගණනය කිරීම හා පවත්වා ගැනීම, අධ්‍යක්ෂවරයා විසින් එම අවශ්‍යතාව සඳහා නිකුත් කරනු ලබන මෙහෙයුම් උපදෙස්වල සඳහන් පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් වාර්ෂික සංචිත පවත්වා ගෙන යෑමේ කාලසටහනට අනුකූලව සිදු කරනු ලැබිය යුතුය.

7. මෙම රීති යටතේ සංචිත අවශ්‍යතාව ගණනය කිරීමේදී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් කාසි හා නෝට්ටු වශයෙන් පවත්වා ගෙන යනු ලබන මුදල්වලින් කොටසක් සංචිත ලෙස ඇතුළත් කිරීමට මහ බැංකුව විසින් පෙර ලබාදී තිබූ පහසුකම පහත සඳහන් පරිදි අදියර දෙකකින් ඉවත් කරනු ලැබේ.

(i) **පළමු අදියර** - 2026 අප්‍රේල් 01වන දින ආරම්භ වන සංචිත පවත්වා ගෙන යෑමේ කාල සීමාවේ සිට බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිය තැන්පතු වගකීම් සාමාන්‍යයෙන් *සියයට දෙක (2%)* ඉක්මවන නමුත්, *සියයට දෙකයි දශම පහක (2.5%)* ප්‍රමාණයක් ඉක්මවා නොයන පරිදි සංචිත අවශ්‍යතාවයෙහි කොටසක් ලෙස කාසි හා නෝට්ටු වශයෙන් පවත්වා ගත හැකිවේ. ඒ අනුව, එම *සියයට දෙක (2%)* ප්‍රමාණයට ඉහළින් පවත්වාගෙන යන ප්‍රමාණයෙන් *සියයට දශම පහක (0.5%)* දක්වා වූ ප්‍රමාණය පමණක් සංචිත අවශ්‍යතාවයෙහි කොටසක් ලෙස පිළිගනු ලැබේ.

(ii) **දෙවන අදියර** - 2026 සැප්තැම්බර් 30 දින ආරම්භ වන සංචිත පවත්වා ගැනීමේ කාල සීමාවේ සිට කාසි හා මුදල් නෝට්ටු, සංචිත අවශ්‍යතාවයෙහි කොටසක් ලෙස පවත්වාගෙන යෑමට බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත ලබාදී ඇති පහසුකම සම්පූර්ණයෙන්ම ඉවත් කරනු ලබන අතර, එදිනට පසු එවැනි ආකාරයෙන් පවත්වා ගන්නා කිසිදු මුදලක් සංචිත අවශ්‍යතාව සපුරාලීම සඳහා සැලකිල්ලට ගනු නොලැබේ.

8. මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් ඉල්ලා සිටිනු ලබන, මහ බැංකුවේ තැන්පත් කර ඇති රුපියල් තැන්පතුවලට අමතරව, වෙනත් වත්කම් ආකාරයෙන් පවත්වා ගෙන යා යුතු සංචිත පිළිබඳව, අධ්‍යක්ෂවරයා විසින් මෙහෙයුම් උපදෙස් මඟින් දැනුම් දෙනු ලැබේ.

9. මෙම රීතිවල අවශ්‍යතාව සඳහා, සංචිත පවත්වා ගැනීමේ කාලසීමාව තුළ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් පවත්වා ගත යුතු අවම දෛනික ශේෂය, අධ්‍යක්ෂවරයා විසින් මෙහෙයුම් උපදෙස් මඟින් නියම කරනු ලැබේ.

10 (i) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පවත්වා ගෙන යනු ලබන සංචිත, අවශ්‍ය අනිවාර්ය සංචිත ප්‍රමාණයට වඩා අඩු වූ විට ඒ සඳහා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් තීරණය කළ පරිදි පවත්නා එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතික මෙන් දෙගුණයකට සමාන පොලියක් අය කරනු ලැබේ.

(ii) එම පොලිය වාර්ෂික පදනමින් ගණනය කර, සංචිතවල පවතින ඌනතාව මත දෛනික පදනමින් අදාළ කරනු ලබන අතර, අදාළ ඌනතාව පවත්නා සම්පූර්ණ කාලසීමාව සඳහාම එකී පොලිය බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් අය කරනු ලැබේ.

(iii) ඉහත (i) සහ (ii) ඡේද යටතේ සංචිතවල පවතින ඌනතාව සඳහා අය කරනු ලබන පොලිය, අදාළ සංචිත පවත්වා ගෙන යෑමේ කාල සීමාව අවසන් වී වැඩ කරන දින තුනකට (3) නොවැඩි කාලයක් ඇතුළත ගෙවිය යුතුය.

(iv) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් පවත්වා ගෙන යනු ලබන සංචිත ප්‍රමාණය, අනිවාර්යයෙන් පවත්වා ගත යුතු සංචිත මට්ටමට වඩා අඩු වූ විට, අදාළ සංචිත පවත්වා ගෙන යෑමේ කාල සීමාව අවසන් වූ පසු එළැඹෙන වැඩ කරන දිනයේදී, අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් එම අවශ්‍යතාව සඳහා නිසි පරිදි බලය පවරන ලද යම් නිලධාරියකු විසින් පහත සඳහන් කරුණු ඇතුළත් නිවේදනයක් අදාළ බැංකුව වෙත නිකුත් කරනු ලබයි.

(අ) එම වාණිජ බැංකුවේ සංචිත ප්‍රමාණය අවශ්‍ය සංචිත ප්‍රමාණයට වඩා අඩු බව
(ආ) සංචිත ඌනතාව පැවති කාල පරිච්ඡේදය
(ඇ) සංචිත ඌනතාවයේ ප්‍රමාණය
(ඈ) සංචිත ඌනතාව මත ගෙවිය යුතු පොලී ප්‍රමාණය
(ඉ) අදාළ පොලිය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවීම සඳහා කරනු ලබන නියෝගය

(v) ඉහත iv ඡේදය යටතේ නිකුත් කරන ලද නිවේදනය, සංචිතවල පවතින ඌනතාව, එම ඌනතාව සඳහා පොලී අය කිරීම සහ මහ බැංකුව වෙත ගෙවිය යුතු පොලී මුදල සම්බන්ධයෙන් අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත ලබාදුන් නිවේදනය නිල සහ ප්‍රමාණවත් නිවේදනයක් ලෙස සලකනු ලැබේ.

11. (i) මෙම රීති 2026 අප්‍රේල් 01වන දින සිට බලපැවැත්වේ.

(ii) 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ ශ්‍රී ලංකා රජයේ 2013 අප්‍රේල් 12වැනි දින අංක 1805/39 දරන (*අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද කලින් කලට සංශෝධනය කරනු ලැබූ "ඈ රෙගුලාසිය" මෙයින් අවලංගු කරනු ලබන අතර ඒ යටතේ නිසි පරිදි සිදු කරනු ලද කිසිවකට අගතියක් නොමැතිව එම රෙගුලාසිය බලාත්මක වීම අත්හිටුවිය යුතු ය.

(iii) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම රීතිවල,

"ශ්‍රී ලංකා මහ බැංකුව" යන්නෙන් 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ ස්ථාපිත ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් කෙරේ.

"තැන්පතු වගකීම්" යන්නෙන් වාණිජ බැංකුවක වන පහත දැක්වෙන සියලුම වගකීම් අදහස් වේ. එනම්, ඉල්ලුම් තැන්පතු, ඉතිරිකිරීමේ තැන්පතු, කාලීන තැන්පතු, වාණිජ බැංකුවක් නොවන වෙනත් ආයතනයක් මගින් අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළෙහි සිදු කර ඇති නිකුතු, ණයවර ලිපි මත වන ආන්තික, විශ්‍රාම අරමුදල් වැනි විශේෂ තැන්පතු යෝජනා ක්‍රම තිබේ නම් ඒවාද, ළමා තැන්පතු යෝජනා ක්‍රම හා එවැනි ස්වභාවයේ වෙනත් යෝජනා ක්‍රමද එසේම භාරයන් වශයෙන් පවත්වා ගෙන යන වත්කම් හෝ ස්වකීය ගනුදෙනුකරුවන් ශ්‍රී ලංකා මුදලින් පවත්වා ගෙන යන තැන්පතු වගකීම් යනාදිය ඇතුළත් නමුත්, අන්තර් බැංකු තැන්පතු ඇතුළත් නොවේ.

"ඉල්ලුම් තැන්පතු" යන්නෙන් ශ්‍රී ලංකා රුපියල්වලින් නාමනය කරනු ලැබූ චෙක්පතකින්, අණකරයකින් හෝ ඇනවුමකින් ඉල්ලා සිටිය විට නීත්‍යානුකූල පිරිනැමීමක් වශයෙන් ගෙවීමට යටත් වන්නා වූද, වාණිජ බැංකුවල සියලු තැන්පතු වගකීම් අදහස් වන නමුත්, කොන්දේසි මත ගෙවීමට යටත් වන එවැනි වගකීම් ඊට ඇතුළත් නොවේ.

"අධ්‍යක්ෂවරයා" යන්නෙන් අදහස් විය යුත්තේ ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාය.

"අවම දෛනික ශේෂය" යන්නෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් අනිවාර්ය සංචිත මට්ටමට අනුකූල වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්වකීය ජංගම ගිණුම්වල දෛනික පදනමින් පවත්වා ගෙන යෑමට අවශ්‍ය වන අවම මුදල් ප්‍රමාණය අදහස් කෙරේ.

"මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය" යන්නෙන් අදහස් කරනුයේ 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 11වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද තීරණ ගන්නා ආයතනයයි.

"එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය" යන්නෙන් අදහස් කරනුයේ මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය නිල වශයෙන් නිරූපණය කිරීමට හා සන්නිවේදනය කිරීමට හඳුන්වා දෙනු ලැබූ ප්‍රතිපත්ති පොලී අනුපාතිකයයි.

"සංචිත අවශ්‍යතාව" යන්නෙන් අදහස් කරන්නේ 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 32වැනි වගන්තිය ප්‍රකාරව, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් තැන්පතු ලෙස පවත්වා ගෙන යෑමට අවශ්‍ය වන තැන්පතු වගකීම්වල අනුපාතයයි.

"සංචිත පවත්වාගෙන යෑමේ කාල සටහන" යන්නෙන් අදහස් කරනුයේ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් තම අනිවාර්ය සංචිත පවත්වා ගෙන යා යුතු එක් එක් කාලසීමාව ආරම්භ වන සහ අවසන් වන දින නිශ්චිතව දක්වා ඇති, වෙළඳපොළ මෙහෙයුම් අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරනු ලබන වසරක් සඳහා වන සංචිත පවත්වාගෙන යෑමේ කාල සීමා දක්වන කාල සටහනයි.

"ඉතිරිකිරීම් තැන්පතු" යන්නෙන් ඉල්ලුම් තැන්පතු සහ කාලීන තැන්පතු හැර ශ්‍රී ලංකා ව්‍යවහාර මුදලින් නාමනය කරන ලද සියලුම තැන්පතු වගකීම් අදහස් කෙරේ.

"කාලීන තැන්පතු" යන්නෙන්, නිශ්චිත කල් පිරෙන කාල සීමාවක් සඳහා භාරගන්නා ලද ඉල්ලුම් කළ විගස ආපසු ලබාගත නොහැකි, පොලියක් සමග ආපසු ගෙවනු ලබන්නා වූ ශ්‍රී ලංකා මුදලින් නාමනය කරන ලද සියලුම තැන්පතු වගකීම් අදහස් කෙරේ.

EOG 03 - 0203

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.